# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

වාණිජ හා කළමණාකරන අධ්‍යයන පීඨය

වාණිජ විද්‍යාවේදී (විශේෂ) උපාධි සිව්වන වසර පරීක්ෂණය (බාහිර)- 2019

2025 - ජුලි

**BCOME 4564** - බැංකු නීතිය හා පරිචය

ප්‍රශ්න සංඛ්‍යාව : (හත) 07 කාලය : පැය 03 යි

ඕනෑම ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

---

ප්‍රශ්න අංක 01

"බැංකුකරු හා ගණුදෙනුකරු අතර පවතින්නේ ගිවිසුම් සබඳතාවයකි. මෙම දෙපක්ෂය අතර ඇති සබඳතාව සාමාන්‍ය ණය ගැති හා ණය හිමි සබඳතාවයක් බව පෙනි ගියත් බැංකුව සපයන වෙනත් සේවා නිසා එම සබඳතාවයට අමතරව නව සබඳතාවයක්ද බිහිවී තිබේ. මේ අනුව විශේෂ යුතුකම් හා අයිතිවාසිකම් ඇතුලත් කොන්දේසි රැසක් මෙම දෙපාර්ශවය අතර පවතී." සාකච්ඡා කරන්න.

(මුළු ලකුණු 20)

ප්‍රශ්න අංක 02

ශ්‍රී ලංකාවේ බැංකු කටයුතු පාලනය කිරීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මහා බැංකුවේ කාර්ය භාරය අදාල අණපනත් ඇසුරින් සාකච්ඡා කරන්න.

(මුළු ලකුණු 20)

ප්‍රශ්න අංක 03

ගණු දෙණු කළහැකි ලියවිලි වලට අදාලව පහත සඳහන් දෑ පැහැදිලි කරන්න.

අ. ගණුදෙණු කළහැකි ලියවිලි වලට නිදසුන්

ආ. ගණුදෙණු කළහැකි ලියවිලි වල පොදු ලක්ෂණ

ඇ. විනිමය බිල්පත් ගණුදෙණු කිරීම

ඈ. "ගණුදෙණු කළ හැකි බව" නම් සිද්ධාන්තය

**(ලකුණු 5x4)**

(මුළු ලකුණු 20)

ප්‍රශ්න අංක 04

"බැංකුකරු හා ගණුදෙනුකරු අතර ඇති ගිවිසුම අනුව බැංකුකරු විසින් ගනුදෙනුකරු වෙත ඉටු කළ යුතු එක් යුතුකමක් නම් බැංකුකරු විසින් ගනුදෙනුකරු ගේ ගිණුම පිළිබඳ රහස්‍යභාවය රැකීමයි. නමුත් මෙම යුතුකම ඉටුනොකළ යුතු අවස්ථා ද තිබේ. " සාකච්ඡා කරන්න.

(මුළු ලකුණු 20)

ප්‍රශ්න අංක 05

අ. චෙක්පත් පිටසන් කරන විවිධ ආකාර සහ පිටසන් කිරීමේදී භාවිතා කරන රීති විස්තර කරන්න.

(ලකුණු 10)

ආ. චෙක්පත් රේඛනය කිරීමේ ප්‍රයෝජන සඳහන් කරමින් චෙක්පත් රේඛනය කරන විවිධ ආකාර සහ අදාල රීති විස්තර කරන්න.

(ලකුණු 10)

(මුළු ලකුණු 20)

ප්‍රශ්න අංක 06

" ශ්‍රී ලංකාවේ බැංකු නීතියේ මූලාශ්‍ර බ්‍රිතාන්‍ය පාලන සමයේ සිටම අදාල ඉංග්‍රීසි නීතියේ අනුසාරයෙන් සකස් වී ඇත. වර්තමානයේ මීට අමතරව දේශීය ව්‍යවස්ථාදායකය විසින් සම්මත කරන ලද අණපනත් ද ශ්‍රී ලංකාවේ බැංකු නීතියේ මූලාශ්‍ර ලෙසට වැදගත් වේ." සාකච්ඡා කරන්න.

(මුළු ලකුණු 20)

ප්‍රශ්න අංක 07

පහත මාතෘකා වලින් **දෙකක්** පිළිබඳ සටහන් ලියන්න.

අ. ශ්‍රී ලංකාවේ සමූපකාර ග්‍රාමීය බැංකු ව්‍යාපාරය

ආ. ගෙවන බැංකුකරු

ඇ. යථා කාලීන දරන්නා

(ලකුණු 10 බැගින්)

(මුළු ලකුණු 20)